මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක **06/2024**

2024.04.10

**ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2024**

2023 වර්ෂයේ වලංගු නාමලේඛනයෙන් ඉවත්වන නම් ඇතුළත් "අ" ලැයිස්තුව (A) සහ 2024 නාමලේඛනයට අළුතින් ඇතුළත්වන නම් ඇතුළත් "ආ" ලැයිස්තුව (B) **2024.04.09** දින සිට **2024.05.06** දින දක්වා පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කෙරේ.

1. සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල /මැතිවරණ කාර්යාල (මුළු දිස්ත්‍රික්කයටම අදාළ)
2. සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල (බල ප්‍රදේශයට අදාළ)
3. සියළුම පළාත් පලාන ආයතන (බල ප්‍රදේශයට අදාළ)
4. සියළුම ග්‍රාම නිලධාරී කාර්යාලවල (ග්‍රාම නිලධාරී වසමට අදාළ)

මෙම කාල සීමාව තුළ දී දැනට වලංගු නාමලේඛනයත්, එයින් ඉවත් කිරීමට යෝජිත නම් ලැයිස්තුව හා ඊට අලුතින් ඇතුළත් කිරීමට නියමිත නම් ලැයිස්තු පරීක්ෂා කර බලා යම්කිසි පුද්ගලයෙකුට තමාගේ නම 2024 වර්ෂයට ලියාපදිංචියට නිර්දේශ වී නොමැති බවට අනාවරණය වේ නම් ඒ සඳහා වූ හිමිකම් ඉල්ලීමක් සහ ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචියට සුදුසුකම් නොලබන අයෙකුගේ නම ලියාපදිංචියට නිර්දේශ වී ඇත්නම් ඊට එරෙහිව විරෝධතාවක් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ඇත. ඊට අදාළ ආකෘති ඉහත නාමලේඛන ප්‍රදර්ශනය කරන ස්ථාන වෙතින් හෝ මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් (www.elections.gov.lk) ලබාගත හැකිය.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission elecomsl